# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2379/03 - 2024 අප්‍රේල් මස 08 වැනි සඳුදා - 2024.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 අප්‍රේල් මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "**2024 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024 මාර්තු මස 25 දිනැති අංක 24/0614/612/034 දරන සංදේශය පිළිබඳ 2024 අප්‍රේල් මස 01 දිනැති, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමග එක්ව කියවනු ලබන එකී සංදේශය සඳහා ලද 2024 අප්‍රේල් මස 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

3. පසුව සංශෝධනය කරන ලද 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

4. ඉහත සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල අංක 9 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, එම රෙගුලාසිවල V වන උපලේඛනයේ ලැයිස්තුගත කර සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0713.31.22 සහ 0713.31.29 යටතේ වර්ගීකරණය කර ඇති උඳු ආනයනය කිරීමට ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත

අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව, ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය හා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සඳහා ආනයන පාලන බලපත්‍ර නිකුත් කළ යුතුය. මුළු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 2,000ක් සඳහා පමණක් අවසර ලබා දෙනු ලැබේ.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "**මෙහෙයුම් උපදෙස්**" නිකුත් කරනු ලැබිය යුතුය.

6. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 04 - 0125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.